සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

නම : ............................................... භූගෝල විද්‍යාව කාලය : පැය 02 යි.

## I කොටස

සැළකිය යුතුයි :

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. ග්‍රාම නිලධාරි කොට්ඨාස කීපයක් එකතු වීමෙන් ........................................ සෑදී ඇත.
(පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)

02. ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය ........................................ දිස්ත්‍රික්කයයි.
(කොළඹ, අනුරාධපුරය, මහනුවර)

03. කාලගුණික මූලිකාංගයක් වන්නේ ........................................ යි.
(උෂ්ණත්වය, භූවිෂමතාව, වනාන්තර)

04. අවිධිමත් භූමි පරිහරණය නිසා ........................................ ඇතිවේ.
(වනවගාව, පාංශු ඛාදනය, පාංශු සංරක්ෂණය)

05. අම්ල වැසි ඇතිවීම නිසා ........................................ සිදුවේ.
(ජලය වාෂ්පවීම, ජලජ ජීවීන් බිහිවීම, පස නිසරුවීම)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් 3 ලකුණ ද වැරදි නම් 6 ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ශීතකරණය භාවිතා කිරීමේ දී දොර අරින වහන වාර ගණන වැඩිකිරීමෙන් විදුලිය ඉතිරි කර ගතහැකිය. (        )

07. මාලිමා යන්ත්‍රය නොමැතිව ද අපට දිශාව හඳුනා ගත හැකිය. (        )

08. ඉන්දියා උපමහද්වීපයේ සිට හමා එන වියළි සුළංවල බලපෑම නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය අඩුවේ. (        )

09. ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය පළාතයි. (        )

10. යම් කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය කාලගුණයයි. (        )

l 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරා නිවැරදි අක්ෂරය දී ඇති වරහන තුළ යොදන්න.

| | | |
|---|---|---|
| A වළාකුළු | B උත්ස්වේදනය | C ප්‍රභාසංස්ලේෂණය |
| D වර්ෂාපතනය | E මතුපිට ගලායාම | F මඳ සුළං |
| G සැඩ සුළං | H ජල වහනය | I වාෂ්පීකරණය |

11. ශාකවලින් ජලය වාෂ්ප වීම මේ නමින් හඳුන්වයි. (        )

12. සෙමෙන් හමන සුළඟකි. (        )

13. ජල වාෂ්ප ඝනීභවනය වීමෙන් මේවා සෑදේ. (        )

14. පොළොවේ ඇති ජලයට සූර්යාලෝකය වැටීමෙන් මෙය සිදුවේ. (        )

15. ප්‍රධාන කාලගුණික අංගයකි. (        )

l 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16. උෂ්ණත්වය හා තාපය ලබා දෙන්නේ ........................................................................ විසිනි.

17. සුළඟේ වේගය මනින ඒකකය වන්නේ ........................................................................ යි.

18. ගෘහ ආශ්‍රිතව කරනු ලබන කර්මාන්තයක් ලෙස වෙස්මුහුණු සෑදීම ........................................................................ ප්‍රදේශයේ දක්නට ලැබේ.

19. වායුව දූෂණය වීමේ ප්‍රතිඵල මිනිසාට පමණක් නොව සතුන්ට හා ........................................................................ වලට ද අහිතකර ලෙස බලපායි.


20. ශ්‍රී ලංකාව අයත් වන්නේ විශාලම මහාද්වීපය වූ ........................................................................ මහාද්වීපයටයි.

## II කොටස

l පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ)





(i) සිතියමෙහි X අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය නම් කර එහි පිහිටා ඇති ප්‍රධාන හින්දු ආගමික කෝවිල නම් කරන්න. (ලකුණු 2)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය නම් කර එය පිහිටි දිස්ත්‍රික්කය අයත් අක්ෂරය නම් කරන්න. (ලකුණු 2)

(iii) B අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය නම් කර එහි මෑතකදී ඉදිකළ ජාත්‍යන්තර වරාය නම් කරන්න. (ලකුණු 2)

(iv) මහනුවර නගරය දැක්වෙන අක්ෂරය නම් කර එහි පිහිටි ප්‍රසිද්ධ බෞද්ධාගමික පූජනීය ස්ථානය නම් කරන්න. (ලකුණු 2)

(ආ) පහත දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) X අක්ෂරයෙන් දැක්වෙන මුහුද හා Y අක්ෂරයෙන් දැක්වෙන බොක්ක නම් කරන්න. (ලකුණු 2)

(ii) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වන පටු මුහුදු තීරය නම් කර එය දැක්වෙන අක්ෂරය ලියන්න. (ලකුණු 2)

(iii) R අක්ෂරයෙන් දැක්වෙන ශ්‍රී ලංකාවේ දිග හා සම්බන්ධ තුඩුව නම් කර එහි අක්ෂරය ලියන්න. (ලකුණු 2)

(iv) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියාවට කුමන දිශාවෙන් ද? (ලකුණු 2)

02. (i) පහත වගුවේ දැක්වෙන්නේ ලෝකයේ පිහිටි දූපත් කිහිපයක් හා ඒවා පිහිටි සාගරයයි. ඒ ඇසුරින් හිස්තැන් පුරවන්න.

| දූපත | පිහිටි සාගරය |
|---|---|
| ජපානය | (1) ................................ |
| නවසීලන්තය | (2) ................................ |
| (3) ................................ | ඉන්දියන් සාගරය |
| බ්‍රිතාන්‍යය | (4) ................................ |

(ලකුණු 4)

(ii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීමට අදාලව නිවැරදිව හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාව ආසියා මහාද්වීපයට (1) ................................................................................ ද ඉන්දියන් සාගරයට (2) ................................................................. ද (3) ........................................................................... බටහිරින් ද (4) ................................................................. නැගෙනහිරින් ද පිහිටා ඇත. (ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවේ පිහිටීම පහත එක් එක් අවස්ථාවට බලපාන ආකාරය වරහන් තුළින් තෝරා පහත සටහන සම්පූර්ණ කරන්න. (ලකුණු 3)

**ශ්‍රී ලංකාවේ පිහිටීම**

| **දේශගුණයට** | **ආර්ථිකයට** | **සංස්කෘතියට** |
|---|---|---|
| **මෝසම් වැසි ලැබීම** | 1. ............................................ | **විවිධ සංස්කෘතික අංග එකතුවීම** |
| 2. ............................................ | **සංචාරක ආකර්ශනය** | 3. ............................................ |

(උෂ්ණත්වය සමනය වීම, නාවික මධ්‍යස්ථානයක් වීම, විවිධ ආගම් පැතිරීම)

03. (i) පහත දැක්වෙන්නේ කාලගුණික අංග සහ ඒවා මනින උපකරණ හා ඒකක දැක්වෙන සටහනකි. එය නිවැරදිව සම්පූර්ණ කරන්න.

**කාලගුණික අංගය**

| | | | |
|---|---|---|---|
| උෂ්ණත්වය | (1) .............................. | සුළඟේ වේගය | (5) .............................. |
| උෂ්ණත්වමානය | (2) .............................. | (4) .............................. | සුළං දිශා දර්ශකය |
| (3) .............................. | මිලි මීටර | පැයට කිලෝමීටර | ඊතලය දැක්වෙන දිශාව |

(ලකුණු 5)

(ii) විවිධ පරිසරවලට අයත් රූපසටහන් කිහිපයක් පහත දැක්වේ. එම රූපවලට අනුව ඊට ගැළපෙන අක්ෂරය ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.




A



B



C



D



E



F

(i) ග්‍රාමීය පරිසරයක පිහිටි නිවස ☐

(ii) නාගරික පරිසරයක පිහිටි නිවස ☐

(iii) කඳුකර බිමක පිහිටි නිවස ☐

(iv) බෑවුම් ප්‍රදේශයක පිහිටි නිවස ☐

(v) වෙරළාශ්‍රිත පරිසරයක පිහිටි නිවස ☐

(vi) වතුකරයේ පිහිටි නිවස ☐

04. (i) පහත දැක්වෙන රූප සටහනේ ශාකවලින් ඇති ප්‍රයෝජන 5ක් ලියන්න.


(1) ..................................................

(2) ..................................................

(3) ..................................................

(4) ..................................................

(5) ..................................................



(ලකුණු 5)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ සත්ත්වයා අයත් අක්ෂරය ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.


A


B


C


D

(1) ඵල හට ගැනීමට අවශ්‍ය පරාගණය සිදු කරයි. ☐

(2) මහාමාරිය රෝගය ඇති කරයි. ☐

(3) රාත්‍රි කාලයේ හැසිරෙයි. ☐

(4) මිනිසාට හානිකර විෂ සහිතයි. ☐ (ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)

.................................................... ....................................................

05. (i) පහත දැක්වෙන්නේ වායුගෝලීය දූෂණය සිදුවන අවස්ථා කිහිපයකි. එම අවස්ථා පිළිවෙලින් නම් කරන්න.

A ..................................................


B ..................................................

C ..................................................

D ..................................................

E ..................................................

F ..................................................





(ලකුණු 6)

(ii) වායුගෝලය දූෂණය වීම නිසා ඇතිවන ස්වසන පද්ධතිය ආශ්‍රිත ඇතිවන රෝග 2ක් නම් කරන්න. (ලකුණු 2)

(iii) අම්ල වැසි ඇති වීමේ ප්‍රතිඵල 3ක් ලියන්න. (ලකුණු 3)

06. (i) පහත දැක්වෙන්නේ ඉවත ලද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ අවස්ථාවන්ය. එම චක්‍රයේ A, B, C අවස්ථා නිවැරදිව නම් කරන්න. (ලකුණු 3)




(ii) පහත දැක්වෙන ඉවතලන අපද්‍රව්‍යවලින් සිදු කළ හැකි නිර්මාණ එක බැගින් ලියන්න.

(a) පොල්කටු

(b) විදුලි බල්බ

(c) රෙදි කැබලි (ලකුණු 3)

(iii) පහත දැක්වෙන්නේ බලශක්ති ප්‍රභව කීපයක් ප්‍රයෝජනයට ගන්නා අවස්ථා කීපයකි. එම අවස්ථාවන්ට අදාළ බලශක්ති ප්‍රභවය නම් කරන්න. (ලකුණු 5)


A



B


C


D


E

07. පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




පහළට

(1) ලොව විශාලතම ද්වීපය මෙය වේ.

(2) ශ්‍රී ලංකාව පිහිටියේ මෙම සාගරයෙහිය.

(3) විකල්ප බලශක්තියකි.

(4) ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍යම දෙයකි.

(5) මේවායෙහි ස්වභාවය නිරීක්ෂණය තුළින් හඳුනාගත හැකිය.

හරහට

(6) ස්වභාවික පරිසර තත්ත්වයකි.

(7) මිනිසාගේ ස්වසනයට අත්‍යවශ්‍ය වායුව මෙයයි.

(8) පිත්තල භාණ්ඩවලට ප්‍රසිද්ධ ප්‍රදේශයකි.

(9) කාලගුණික තොරතුරු දැන ගැනීමට වඩාත් වැදගත් වන පුද්ගලයෙකි.

(10) මේවා මගින් සූර්ය ශක්තිය අවශෝෂණය කර එයින් බලශක්තිය නිපදවා ගත හැකිය.

(11) බීජ ව්‍යාප්ත කරන සත්ත්වයෙකි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

## I කොටස

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2. අනුරාධපුරය
3. උෂ්ණත්වය
4. පාංශු ඛාදනය
5. පස නිසරුවීම
6. 5
7. 4
8. 5
9. 4
10. 4
11. B
12. F
13. A
14. I
15. D
16. සූර්යයා
17. පැයට කිලෝමීටර
18. අම්බලන්ගොඩ
19. ශාක
20. ආසියා

ලකුණු 2 5 20 = 40

## II කොටස

01. (අ) (i) ත්‍රිකුණාමලය - කෝනේෂ්වරම් කෝවිල
 (ii) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ F
 (iii) හම්බන්තොට - හම්බන්තොට වරාය
 (iv) H - දළදා මාලිගාව
 (ආ) (i) x අරාබි මුහුද - y බෙංගාල බොක්ක
 (ii) පෝක් සමුද්‍ර සන්ධිය P
 (iii) දෙවුන්දර තුඩුව R
 (iv) දකුණු දිශාවෙන්

02. (i) (1) පැසිපික් සාගරය
 (2) පැසිපික් සාගරය
 (3) ශ්‍රී ලංකාව, මාලදිවයින, අන්දමන්, නිකොබාර්, (නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.)
 (4) අත්ලාන්තික් සාගරය
 (ii) (1) දකුණින් (2)උතුරින් ද
 (3) ගිණිකොන දිග ආසියාව
 (4) අප්‍රිකානු මහාද්වීපය
 (iii) නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (පෙළපොත පිටු අංක 56)

03. (i) (1) වර්ෂාපතනය (2) වර්ෂාමානය
 (3) සෙල්සියස් අංශක, ෆැරන්හයිට් අංශක
 (4) අනිල මානය සුළඟේ දිශාව
 (ii) C, B, A, F, E, D

04. (i) ශාකවලින් ඇති ප්‍රයෝජන ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
 (ii) (1) B (2) A (3) C
 (4) D
 (iii) අඩවිය, සුදුරෙදි හොරා, සිවුරුහොරා, (නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.)

05. (i) නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.
 (ii) කැස්ස, පෙනහලු පිළිකා, පීනස, ඇදුම, හිසරදය
 (iii) ජලය දූෂණය වීම, ජලජ ජීවන් විනාශ වීම, වන විනාශය, පසට හානි වීම

06. (i) A - ප්‍රතිචක්‍රීකරණය,
 B - බෙදා වෙන් කිරීම,
 C - ප්‍රවාහනය
 (ii) (a) පොල්කටු හැඳි, විසිතුරු භාණ්ඩ
 (b) ලාම්පු
 (c) පාපිසි, කුෂන් කවර
 (iii) A - ජල විදුලිය
 B - සුළං ශක්තිය
 C - ඛනිජ තෙල්
 D - ස්වභාවික ගෑස්
 E - දර

07.

| පහළට | හරහට | |
|---|---|---|
| 1.ග්‍රීන්ලන්තය | 6. | වනාන්තර |
| 2.ඉන්දියන් | 7. | ඔක්සිජන් |
| 3.ජීව වායුව | 8. | පිළිමතලාව |
| 4.ජලය | 9. | ධීවරයා |
| 5.වලාකුළු | 10. | සූර්යකෝෂ |
| | 11. | වවුලා |